# ස්වයංරැකියා විභවතාවයන් පිළිබඳ සමීක්ෂණය

## 2017



මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ අංශය
මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

# ස්වයංරැකියා විභවතාවයන් පිළිබඳ සමීක්ෂණය-2017

**(සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින්**
**2016 වර්ෂය තුළ සංවිධානය කරන ලද වැඩසටහන් යටතේ**
**ප්‍රතිලාභීන් විසින් ආරම්භ කරන ලද**
**ස්වයං රැකියා අනුබද්ධිතව සිදු කරන ලද අධ්‍යයනයකි)**


**දත්ත සම්පාදනය**

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි**

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න - අධ්‍යක්ෂ ජනරාල්**

**ඒ.ජී.වෙල්ලපිලි මයා - අධ්‍යක්ෂ (සමාජ සවිබල ගැන්වීම්)**

**එච්.කේ.රණවීර මයා-නියෝජ්‍ය අධ්‍යක්ෂ(සමාජ සවිබල ගැන්වීම්)**

**සහ සියලු ක්ෂේත්‍ර නිලධරයන්**

**සමීක්ෂණය සැලසුම් කිරීම, දත්ත විශ්ලේෂණය හා වාර්තාකරණය:**

**කේ.කේ.ඩී.කේ.එස්.සෝමරත්න මයා**

**සංවර්ධන නිලධාරි**

**උපදෙස් හා මෙහෙයවීම:**

**සුනිල් අබේවර්ධන මයා - අධ්‍යක්ෂ ජනරාල්(රා.ආ.)**

**ර්.එල්.කේ.දිසානායක මයා - අධ්‍යක්ෂ**

**වයි.ර්.හිඟුරුදූව මිය - සහකාර අධ්‍යක්ෂ**



**සහාය**

**මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශයේ කාර්ය මණ්ඩලය**

Department of Manpower and Employment
Ministry of Labour, Trade Union Relation and Sabaragamuwa Development

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

# පටුන


දත්ත වගු ....................................................................................................iii

රූප සටහන් ....................................................................................................iv

I වන පරිච්ඡේදය .................................................................................................... 1

1.1හැඳින්වීම .................................................................................................... 1

1.2සමීක්ෂණ ක්‍රමවේදය .................................................................................................... 4

II වන පරිච්ඡේදය .................................................................................................... 5

2.1.සමස්ථ දත්ත විශ්ලේෂණය .................................................................................................... 5

2.2. ප්‍රතිලාභින්ගේ වෘත්තීමය සංවර්ධනය .................................................................................................... 7

2.3. තිරසර පැවැත්ම .................................................................................................... 10

2.3.3 ස්වයංරැකියාව වැඩිදියුනු කිරීමට අවශ්‍ය පහසුකම් .................................................................................................... 12

III වන පරිච්ඡේදය .................................................................................................... 14

3.1.දත්ත විශ්ලේෂණය .................................................................................................... 14

3.2 ප්‍රතිලාභින්ගේ වෘත්තීමය සංවර්ධනය .................................................................................................... 17

3.3. තිරසර පැවැත්ම .................................................................................................... 22

IV වන පරිච්ඡේදය .................................................................................................... 26

4.1. නිගමන හා යෝජනා .................................................................................................... 26

විශේෂ ස්තූතිය .................................................................................................... 28

# දත්ත වගු

වගුව අංක 1.1 මෙම වැඩසටහන යටතේ එක් එක් අංශය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රතිශත. ........ 1

වගුව 1.2 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සාරාංශය - 2016 ........ 2

වගුව 1.3 පරිසර හිතකාමී ආදර්ශ ගම්මාන වැඩසටහන ........ 3

වගුව 1.4 ලබාදුන් විවිධ සහනයන් ........ 4

වගුව 1.5 සහනාධාරලාභීන් හා නියැදිය ........ 4

# රූප සටහන්


රූප සටහන 2.1.1 ප්‍රතිලාභීන්ගේ වයස් ව්‍යාප්තිය ........ 5

රූප සටහන 2.1.2 ප්‍රතිලාභීන්ගේ ස්ත්‍රී - පුරුෂ ව්‍යාප්තිය ........ 5

රූප සටහන 2.1.3 ප්‍රතිලාභීන්ගේ සිවිල් තත්ත්වය ........ 6

රූප සටහන 2.2.1ප්‍රතිලාභීන්ගේ වෘත්තීය ක්ෂේත්‍රයන් ........ 7

රූප සටහන 2.2.2 ප්‍රතිලාභීන්ගේ මාසික ආදායම් ව්‍යාප්තිය ........ 8

රූප සටහන 2.2.3 නව රැකියා අවස්ථා නිර්මාණය වීම ........ 9

රූප සටහන 2.2.4 ප්‍රතිලාභීන්ගේ අමතර ආර්ථික කටයුතු ........ 9

රූප සටහන 2.2.5 ස්වයං රැකියාව තෝරා ගැනීමට බලපානලද හේතු ........ 10

රූප සටහන 2.3.1 ස්වයං රැකියාව පවත්වාගෙන යාමේදී මුහුණ දෙන ගැටළු ... 10

රූප සටහන 2.3.2 ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමට කැමැත්ත ........ 11

රූප සටහන 2.3.3 සවයං රැකියාව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් ........ 13

රූප සටහන 2.3.4 නිර්මාණය කලහැකි රැකියා අවස්ථා ගණන ........ 13

රූප සටහන 3.1.1 දිස්ත්‍රික්ක මට්ටමින් වයස් ව්‍යාප්තිය ........ 14

රූප සටහන 3.1.2 දිස්ත්‍රික්ක මට්ටමින් ස්ත්‍රී-පුරුෂ ව්‍යාප්තිය ........ 15

රූප සටහන 3.1.3 ප්‍රතිලාභීන්ගේ සිවිල් තත්ත්වය ........ 16

රූප සටහන 3.1.4 ප්‍රතිලාභීන්ගේ අධ්‍යාපන තත්ත්වය දිස්ත්‍රික්කයන් අනුව ....... 17

රූප සටහන 3.2.1 ප්‍රතිලාභීන් නිරත වන වෘත්තීය ක්ෂේත්‍ර දිස්ත්‍රික්ක මට්ටමින්17

රූප සටහන 3.2.2 ප්‍රතිලාභීන්ගේ මාසික ආදායම් ව්‍යාප්තිය දිස්ත්‍රික්ක අනුව ... 18

රූප සටහන 3.2.3 නව රැකියා අවස්ථා නිර්මාණයවීම ........ 19

රූප සටහන 3.2.4 අමතර ආර්ථික කටයුතු වල යෙදීම ........ 20

රූප සටහන 3.2.5 ස්වයං රැකියාව තෝරා ගැනීමට හේතු ........ 21

රූප සටහන 3.3.1 ස්වයං රැකියා පවත්වාගෙන යාමේදී මුහුණ දෙන ගැටළු ...... 22

රූප සටහන 3.3.2 ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමට කැමැත්ත ........ 23

රූප සටහන 3.3.3 ස්වයං රැකියාව වැඩිදියුණු කිරීමට අවශ්‍ය පහසුකම් ........ 24

රූප සටහන 3.3.4 උත්පාදනය වියහැකි රැකියා අවස්ථා ........ 25

# I වන පරිච්ඡේදය

## 1.1හැඳින්වීම

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ අංශය මගින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සහයෝගය සහිතව මෙම ස්වයංරැකියා විභවතාවයන් පිළිබඳ සමීක්ෂණය සිදු කරන ලද අතර එමගින් හම්බන්තොට, පුත්තලම, යාපනය, මඩකලපුව යන දිස්ත්‍රික්කයන් හි 2016 වසර තුළ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දියත්කරන ලද "ජීවනෝපාය සංවර්ධන" හා "පරිසර හිතකාමී ආදර්ශ ගම්මාන" යනාදී සමෘද්ධි වැඩසටහන්වල ප්‍රතිලාභීන් වෙත අදාළ වැඩසටහන් හරහා ලද සෘජු ප්‍රතිලාභයන් වශයෙන් ස්වයං රැකියා අවස්ථා ජනිත වීම පිළිබඳව අධ්‍යයනය කරන ලදී.

ජීවනෝපාය සංවර්ධන වැඩසටහන අඩු ආදායම්ලාභී පවුල්වල ආදායම් මට්ටම ඉහල නැංවීම, සෞඛ්‍ය හා පෝෂණ මට්ටම වැඩිකිරීම, රැකියා අවස්ථා පුළුල් කිරීම තුලින් දිළිඳුකම ඉතා අවම මට්ටමකට පත්කිරීම පරමාර්ථ කරගෙන ක්‍රියාත්මක වන අතර එමගින් දේශීය නිෂ්පාදිතයට අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ දායකත්වය ඉහල නැංවීමට අපේක්ෂිතය.

ප්‍රජාමූල සංවිධාන, දිවිනැගුම ප්‍රජාමූල බැංකු සහ දිවිනැගුම නිලධාරීන් මෙන්ම අදාල තාක්ෂණික සහය සේවා සපයන අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල ඒකාබද්ධතාවයෙන් යුතුව ඉතා ඉහල සංවර්ධන විභවතාවයක් සහිත ජීවනෝපාය ව්‍යාපෘති හඳුනාගැනීමත්, කුඩා පරිමාන ව්‍යාවසායන් ප්‍රවර්ධනයත්, නව ව්‍යවාසායකයින් බිහිකිරීමත්, රැකියා වෙළඳපලට සරිලන පුහුණු ශ්‍රමිකයින් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමත් අරමුණු කරගනිමින් ව්‍යාපෘති සැලසුම් කර ඇත.

### *වගුව අංක 1.1 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ එක් එක් අංශය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රතිශත.*

| අංශය | | ප්‍රතිපාදනයේ ප්‍රතිශතය(%) | විශේෂ කරුණු |
|---|---|---|---|
| 1 | කෘෂි කාර්මික සංවර්ධනය | 20 | අත්‍යාවශ්‍ය වේ නම් පමණක් මෙම ප්‍රතිශතයෙන් 5% කින් අඩු හෝ වැඩි වනලෙස ගලපාගත හැකිය. (60% ක උපරිමය තුළ) |
| 2 | පශු සම්පත් සංවර්ධනය | 18 | |
| 3 | ධීවර කටයුතු සංවර්ධනය | | |
| 4 | සුළු පරිමාණ කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධනය | 22 | |
| 5 | රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුනු වැඩසටහන | 40 | මෙම සීමාව කිසිසේත් අඩු නොකල යුතුය.(අවමය 40%) |

(මූලාශ්‍රය: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව)

පරිසර හිතකාමී ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන හා ඒකාබද්ධව "වස විස නැති රටක් "සහ "ධාර්මික ගොවිතැනක් , නිරෝගී ජනතාවක්" බිහිකිරීමේ අරමුණින් ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් සමෝධානික, බහු ආංශික, පරිසර හිතකාමීවූ ආදර්ශ ගම්මාන නිර්මාණය කිරීම අපේක්ෂා කර ඇත.

මෙම වැඩසටහන සඳහා විවිධ ක්ෂේත්‍රවලට අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් සපිරි උචිත පාරිසරික තත්වයන්ගෙන් හෙබි ගම්මාන තෝරාගෙන ප්‍රතිලාභීන් තෝරාගැනීමේදී

අඩු ආදායම්ලාභී පවුල් මෙන්ම ආදර්ශ ගම්මානය නිර්මාණය කිරීමට අවශ්‍ය විශේෂ හැකියාවන් ඇති සාමාජිකයින් සිටින පවුල් තෝරාගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කර ඇත.

තවද, යම් විශේෂ නිෂ්පාදන සේවා ක්ෂේත්‍රයන් එකක් හෝ කීපයක් වඩාත් උසස් මට්ටමකට පත්කොට, අනෙකුත් ප්‍රජාවට ආදර්ශයක් සැපයිය හැකි වන පරිදි, සංවර්ධන සැලැස්ම 2019 වර්ෂය දක්වා වන පරිදි සකස් කොට ඒ ඒ වසරේ ක්‍රියාත්මක කළ හැකි අදියරයන් වෙන් වෙන්ව හඳුනා ගැනීමට අදාල ක්ෂේත්‍ර නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත.

මෙම වැඩසටහන යටතේ එක් ගම්මානයක් සඳහා රු. මිලියන 6 ක් පමණ වෙන් කිරීමටද ජීවනෝපාය හා අලවි ව්‍යාපෘති සඳහා අවම වශයෙන් 20% ක වත් ප්‍රතිලාභී දායකත්වය ලබා ගැනීමටද අපේක්ෂා කර ඇත. ක්ෂුද්‍ර මූල්‍ය අංශයේ ණය වැඩසටහන් වලට අමතරව ජීවනෝපාය චක්‍රීය ණය අරමුදල ද ණය ලබාදීමට උපරිම ලෙස භාවිතයට ගැනීම ද වෙනත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, ප්‍රජා සංවිධාන/පෞද්ගලික අංශය /දානපතීන් වැනි පුද්ගලයින්ගේ සහභාගිත්වය ලබාගැනීමට ද සැලසුම්කර ඇත.

ඉහත දැක්වෙන පරිදි, 2016 වර්ෂය තුල ක්‍රියාත්මක කල ව්‍යාපෘති පිළිබඳව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කල ප්‍රගති වාර්තා අනුව ප්‍රතිලාභීන් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

වගුව 1.2 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් සාරාංශය 2016

| අනු අංකය | දිස්ත්‍රික්කය | අවසන් කල වැඩ සටහන් සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | කෘෂිකර්ම | සත්ව පාලන | ධීවර | ව්‍යවසාය සංවර්ධන | රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණුව | එකතුව |
| 1 | කොළඹ | 106 | 170 | 2 | 460 | - | 738 |
| 2 | ගම්පහ | 80 | 314 | 16 | 397 | 304 | 1,111 |
| 3 | කළුතර | 288 | 576 | 12 | 306 | 213 | 1,395 |
| 4 | ගාල්ල | 208 | 205 | | 265 | 192 | 870 |
| 5 | මාතර | 136 | 81 | 14 | 332 | 219 | 782 |
| 6 | හම්බන්තොට | 93 | 45 | 6 | 192 | 100 | 436 |
| 7 | මහනුවර | 84 | 326 | 2 | 236 | 254 | 902 |
| 8 | මාතලේ | 138 | 102 | 5 | 79 | 93 | 417 |
| 9 | නුවරඑළිය | 108 | 153 | 1 | 69 | 92 | 423 |
| 10 | කුරුණෑගල | 153 | 980 | 6 | 391 | 314 | 1,844 |
| 11 | පුත්තලම | 21 | 172 | 27 | 60 | 75 | 355 |
| 12 | බදුල්ල | 517 | 243 | | 75 | 95 | 930 |
| 13 | මොණරාගල | 328 | 161 | 12 | 42 | 111 | 654 |
| 14 | කෑගල්ල | 111 | 228 | | 332 | 122 | 793 |
| 15 | රත්නපුර | 340 | 52 | 3 | 1831 | 93 | 2.319 |
| 16 | අනුරාධපුර | 222 | 165 | 5 | 122 | 158 | 672 |
| 17 | පොලොන්නරුව | - | 164 | - | 4 | 118 | 286 |
| 18 | අම්පාර | 12 | 46 | | 23 | 318 | 399 |
| 19 | ත්‍රිකුණාමලය | 86 | 307 | 8 | 68 | 137 | 606 |
| 20 | මඩකලපුව | 85 | 90 | 3 | 88 | 246 | 512 |
| 21 | වව්නියාව | 41 | 31 | | 31 | 26 | 129 |
| 22 | යාපනය | 117 | 116 | 68 | 115 | 101 | 517 |
| 23 | මන්නාරම | 13 | 10 | 2 | 8 | 68 | 101 |
| 24 | මුලතිව් | 48 | 82 | 15 | 48 | 23 | 216 |
| 25 | කිළිනොච්චිය | 38 | 33 | 10 | 13 | 30 | 124 |
| | එකතුව | 3,373 | 4.852 | 217 | 5,587 | 3,502 | 17,531 |

(මූලාශ්‍රය: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව)

## වගුව 1.3 පරිසර හිතකාමී ආදර්ශ ගම්මාන වැඩසටහන සාරාංශය-2016

| අනු අංකය | දිස්ත්‍රික්කය | සංඛ්‍යාව | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | කෘෂි සංවර්ධන | සත්ත්ව පාලන | කර්මාන්ත | අලවි | යටිතල පහසුකම් | සමාජ සංවර්ධන | පුහුණු | එකතුව |
| 1 | කොළඹ | 230 | 29 | 5 | | | | 1 | 264 |
| 2 | ගම්පහ | 585 | 0 | 78 | 51 | 16 | 0 | 5 | 730 |
| 3 | කළුතර | 168 | 12 | 9 | 0 | 7 | | 2 | 196 |
| 4 | ගාල්ල | 74 | 0 | 135 | | 8 | 0 | 8 | 217 |
| 5 | මාතර | 70 | 0 | 40 | | 8 | 38 | 4 | 156 |
| 6 | හම්බන්තොට | 65 | 31 | 66 | 27 | 3 | 0 | 0 | 192 |
| 7 | මහනුවර | 50 | 27 | 60 | 7 | 8 | 0 | 2 | 152 |
| 8 | මාතලේ | 15 | 7 | 65 | | 7 | 19 | | 113 |
| 9 | නුවරඑළිය | 60 | 27 | 25 | 2 | 2 | 0 | 3 | 116 |
| 10 | කුරුණෑගල | 32 | 30 | 38 | | 5 | 13 | 4 | 118 |
| 11 | පුත්තලම | 8 | 0 | | | 13 | | | 21 |
| 12 | බදුල්ල | 97 | 14 | 12 | 15 | 1 | 3 | 0 | 142 |
| 13 | මොණරාගල | 56 | | 79 | | 5 | | 2 | 140 |
| 14 | කෑගල්ල | 1,342 | 159 | 2 | 3 | | 0 | 0 | 1,506 |
| 15 | රත්නපුර | 104 | 3 | 11 | 8 | 13 | 0 | 1 | 139 |
| 16 | අනුරාධපුර | 7 | 23 | 8 | 15 | | | 1 | 53 |
| 17 | පොලොන්නරුව | 392 | 189 | 72 | 22 | 2 | 1 | 0 | 678 |
| 18 | අම්පාර | 86 | 36 | 87 | 16 | 3 | 0 | 0 | 228 |
| 19 | ත්‍රිකුණාමලය | 25 | 8 | 1 | | 3 | | | 37 |
| 20 | මඩකලපුව | 9 | 18 | | 3 | 2 | | | 32 |
| 21 | වව්නියාව | 41 | 27 | 12 | 8 | | | 1 | 88 |
| 22 | යාපනය | 10 | 15 | 39 | 1 | | | | 65 |
| 23 | මන්නාරම | 94 | 16 | 6 | | | | | 116 |
| 24 | මුලතිව් | 16 | 93 | 4 | 1 | 3 | | | 117 |
| 25 | කිළිනොච්චිය | 240 | 98 | 33 | | 1 | | 15 | 372 |
| මුළු එකතුව | | 3,876 | 862 | 887 | 179 | 110 | 74 | 49 | 5,988 |

(මූලාශ්‍රය: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව)

## 1.2සමීක්ෂණ ක්‍රමවේදය

මෙම සමීක්ෂණයෙහි අධ්‍යයනය සඳහා හඳුනාගත් ව්‍යාපෘති යටතේ අදාළ ප්‍රතිලාභින් වෙත සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ලබා දුන් විවිධ සහනයන් පහත අයුරු දැක්විය හැක.

*වගුව 1.4 ලබාදුන් විවිධ සහනයන්*

| ක්ෂේත්‍රය | සහනාධාර වර්ගය |
|---|---|
| **කෘෂිකර්ම** | වතුර මෝටර් පොම්ප, ගෙවතු වගා (කෙසෙල්, වම්බටු) ලූණු බීජ, විසිතුරු පැල වගාව, විද්‍යුත් තරාදි |
| **සත්ව පාලනය** | ගව ගාල්, එළු කොටු, කුකුල් කූඩු, බිත්තර සඳහා කිකිළියන් |
| **කර්මාන්ත** | මහන මැෂින්, කැමරා උපකරණ, සම්භාන්ඩ උපකරණ, රාක්ක, අල්මාරි ඉහුම් පිහුම් උපකරණ, මෝටර් කාර්මික උපකරණ, ගුවන්විදුලි උපකරණ, |
| **පුහුණු වැඩසටහන්** | වෘත්තීය මාර්ගෝපදේශනය, ඇඳුම් මැසීමේ පුහුණුව, හෙද පුහුණුව, බැකෝ යන්ත්‍ර පුහුණුව, තොරතුරු තාක්ෂණ පුහුණුව, කෝකි පුහුණුව |
| **ධීවර කර්මාන්තය** | දැල් ආම්පන්න, වියළි මසුන් |
| **එළවළු වගාව** | ගෙවතු වගා, බතල, පතෝල, මඤ්ඤොක්කා |
| **රුක් රෝපනය** | රෝපණ බීජ (අඹ) |
| **වන වගාව** | රෝපණ පැළ (තේක්ක) |

(මූලාශ්‍රය: සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව)

ඉහත දක්වන ලද සෑම ව්‍යාපෘති වර්ගයක්ම නියෝජනය වන පරිදි සහනාධාරලාභීන් මෙම සමීක්ෂණය සඳහා තෝරා ගන්නා ලදී. අදාල දිස්ත්‍රික්කයන්, සහනාධාරලාභී සංඛ්‍යාව, නියැදි ගණන, ප්‍රතිචාර දැක්වූ ගණන, ප්‍රතිචාර අනුපාතය පහත දැක්වේ.

*වගුව 1.5 සහනාධාරලාභීන් හා නියැදිය*

| දිස්ත්‍රික්කය | සහනාධාරලාභීන් ගණන | නියැදිය | ප්‍රතිචාර දැක්වූ සංඛ්‍යාව | ප්‍රතිචාර ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| මඩකලපුව | 7640 | 410 | 365 | 89.02 |
| හම්බන්තොට | 449 | 344 | 284 | 82.56 |
| යාපනය | 517 | 447 | 429 | 95.97 |
| පුත්තලම | 451 | 307 | 298 | 97.07 |

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඇතුළු ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයන්ගේ අනුග්‍රහය සහිතව සැලසුම් කරන ලද මෙම සමීක්ෂණයේ දී, දත්ත රැස්කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ ක්‍රියාකාරී සහය ද ලැබුනු බැවින් සමීක්ෂණයට තොරාගන්නා ලද නියැදියට අයත් වූ ප්‍රතිලාභීන් වෙතින් ඉහල ප්‍රතිචාරයක් ලබා ගැනීමට හැකි වී ඇත.

හම්බන්තොට, පුත්තලම, යාපනය, මඩකලපුව යන දිස්ත්‍රික්කයන්හි සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සහනාධාරලාභීන් අතුරින් අහඹු නියැදි ක්‍රමවේදය යටතේ සියලුම ව්‍යාපෘතීන් නියෝජනය වන පරිදි තෝරාගත් ප්‍රතිලාභීන් සමූහයක් මෙම සමීක්ෂණය සඳහා උපයෝගි කරගන්නා ලදී. විධිමත් ප්‍රශ්නාවලියක් මගින් අදාල සමෘද්ධි සහනාධාරලාභීන් වෙතින් තොරතුරු රැස්කිරීම සිදුකෙරිනි. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවහි මානව සම්පත් සංවර්ධන නිලධාරින් හා සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ සහය ලැබුනු බැවින් දත්ත රැස් කිරීම පහසු කාර්යයක් විය.

# II වන පරිච්ඡේදය

## 2.1.සමස්ථ දත්ත විශ්ලේෂණය

සමීක්ෂණයේ සමස්ථ දත්ත විශ්ලේෂණය SPSS මෘදුකාංගය භාවිතා කර සිදුකෙරිනි.

රූප සටහන 2.1.1 ප්‍රතිලාභීන්ගේ වයස් ව්‍යාප්තිය




ඉහත දක්වා ඇති පරිදි, වයස අවුරුදු 30 ට වැඩි කාණ්ඩයට අයත් වන සහනාධාරලාභීන් ප්‍රමාණය සමීක්ෂණයට යොදාගත් සමස්ත නියැදියෙන් ආසන්න වශයෙන් 75%ක ප්‍රමාණයකි. ඒ අනුව, ප්‍රතිලාභීන් බහුතර ප්‍රමාණයක් තරුණ වයසේ ශ්‍රම බලකායට අයත් නොවන බව පැහැදිළි ය. එසේ වුවද, තරුණයන් ස්වයං රැකියා සඳහා යොමු කිරීම වඩාත් ඵලදායී ආයෝජනයක් වන බැවින්, සමෘද්ධි ප්‍රතිලාභී කුටුම්භයන්හි තරුණ තරුණියන් ඉලක්ක වන පරිදි නව වෘත්තීය ක්ෂේත්‍රයන් යටතේ වැඩසටහන් සංවිධානය කිරීම යෝග්‍ය වනු ඇත.

රූප සටහන  2.1.2 ප්‍රතිලාභීන්ගේ ස්ත්‍රී-පුරුෂ ව්‍යාප්තිය




සමීක්ෂණයට ලක් කරන ලද නියැදියෙහි ස්ත්‍රී-පුරුෂ ව්‍යාප්තිය සැලකීමේ දී, මෙම ස්වයං රැකියා වැඩසටහන් හි ප්‍රතිලාභීන් අතරින් 55.4% ක් කාන්තාවන් වේ. ශ්‍රී ලංකාවේ ජනගහන සංයුතිය සැලකීමේ දී මෙම ප්‍රතිශතය සාපේක්ෂව ඉහළ විචලතාවයක්

නොපෙන්වුවද, ශ්‍රම බලකාය සඳහා සහ විශේෂයෙන් ම ස්වයං රැකියා ක්ෂේත්‍රයේ කාන්තා දායකත්වය[1] සැලකීමේ දී සමෘද්ධි ව්‍යාපාරය යටතේ වන මෙම ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ඉහළ කාන්තා සහභාගීත්වයක් පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව, ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම දායකත්වය ඉහළ නැංවීම උදෙසා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද මෙම වැඩසටහන් මගින් යහපත් දායකත්වයක් ලබා දී ඇති බව දැක්විය හැක.

රූප සටහන 2.1.3 ප්‍රතිලාභීන්ගේ සිවිල් තත්ත්වය




මෙම සමීක්ෂණයට සහභාගී වූ ප්‍රතිලාභීන්ගෙන් ඉහළ බහුතරයක් විවාහක අය බව පැහැදිළි වේ. සමෘද්ධි සහනාධාර ව්‍යාපෘතිවල මූලික අරමුණ වනුයේ අඩු ආදායම්ලාභී කුටුම්භයන් දිරිමත් කොට ජීවනෝපාය සලසාදීම මගින් ඉහළ ආර්ථික හැකියාවන් ඇති කිරීම බැවින්, විවාහක සමෘද්ධිලාභීන් ප්‍රමාණය ඉහල අගයක් ගෙන ඇත.

රූප සටහන 2.1.4 ප්‍රතිලාභීන්ගේ අධ්‍යාපන තත්ත්වය




ඉහත දැක්වෙන රූපසටහනට අනුව, සමෘද්ධිලාභීන්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහල යන විට අදාළ ප්‍රතිලාභී සංඛ්‍යාතය පහල ගොස් ඇත. ඒ අනුව, සමීක්ෂණයට බඳුන් වූ සියළුම ප්‍රතිලාභීන් අතුරින්, අ.පො.ස. (සාමාන්‍ය පෙළ)ට පහළ අධ්‍යාපන මට්ටමක සහිත අය 48.3% කි. අඩු අධ්‍යාපනය හා දිළිඳුභාවයේ විෂම චක්‍රය පිළිබඳ පිළිගත් මතවාද අනුව ද,

[1] 2016 ශ්‍රම බලකා සමීක්ෂණ වාර්තාව අනුව, ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය සඳහා කාන්තා දායකත්වය 36.2% වන අතර, ස්වයං රැකියාවන්හි නියුක්ත වන්නන්ගෙන් කාන්තා නියෝජනය 28.9% ක් පමණි.

සමෘද්ධි ආධාර සඳහා නිර්දේශ වීමේ වැඩි ප්‍රවණතාවයක් සහිත අඩු අධ්‍යාපනයක් සහිත අයවළුන් මෙම සමීක්ෂණය සඳහා යොදාගත් ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන් වෙත වැඩි වශයෙන් යොමු වීමේ ඉහළ සම්භාවිතාවයක් පවතී.

## 2.2. ප්‍රතිලාභීන්ගේ වෘත්තීමය සංවර්ධනය

රූප සටහන 2.2.1ප්‍රතිලාභීන්ගේ වෘත්තීය ක්ෂේත්‍රයන්




| | | | |
|---|---|---|---|
| 61 | ක්ෂේත්‍ර භෝග හා එළවළු වවන්නන් හා සත්ව පාලනය | 51 | පිරිසිදු කරන්නන් හා කාර්යාලවල ගෘහපාලන අධීක්ෂකවරුන් |
| 81 | ලිං කපන්නන්, බෝරකරුවන්, ශිලා සැකසුම්කරුවන් | 74 | විදුලි කාර්මිකයින් හා සේවා සපයන්නන් |
| 71 | මේසන්වරුන්, වඩු වැඩකරුවන් | 75 | ලී වැඩ, යන්ත්‍ර සැකසුම් කරුවන් හා ක්‍රියාකරුවන් |
| 52 | සෞඛ්‍ය සේවා සහයකයින්, වෙළඳ සහයකයින් | 94 | මුළුතැන්ගෙයි උදව්කරුවන් |
| 62 | වන හා ආශ්‍රිත සේවකයින්, ධීවර කටයුතු කරන්නන් | 91 | ගෘහස්ථ පිරිසිදු කරන්නන් හා උදව් කරුවන් |
| 31 | රසායන හා භෞතික විද්‍යා තාක්ෂණඥයින්, ආකර හා මැනුම් තාක්ෂණඥයින් | 53 | ගෘහස්ථ පදනම් කරගත් සාත්තු සේවකයින් |
| 92 | ගොවිපල කම්කරුවන්, වනෝද්‍යාන කම්කරුවන් | 32 | හෙද හා ආශ්‍රීත වෘත්තිකයන් |
| 72 | උපකරණ සාදන්නන්, මෝටර් වාහන සාදන්නන් හා කාර්මිකයින් | 41 | පද සැකසුම් ක්‍රියාකරුවන් |
| 83 | කාර්, වෑන්, කුලීරථ, දොඹකර පදවන්නන් | 34 | සමාජීය කටයුතු ආශ්‍රීත වෘත්තිකයින් |
| 73 | වර්ගීකරණය නොකල හස්ත කර්මාන්ත සේවකයන් | 26 | සමාජීය කටයුතු හා උපදේශක වෘත්තිකයින් |

සමීක්ෂණය සඳහා තෝරාගත් දිස්ත්‍රික්ක හතරෙහි ප්‍රතිලාභීන් අතුරින්, ක්ෂේත්‍ර භෝග වගා හා එලවළු වවන්නන් හා සත්ත්ව පාලනය කරන්නන් ගණන ඉහලම අගයක් ගනු ලබන අතර, පද සැකසුම්කරුවන්, සමාජීය කටයුතු ආශ්‍රිත වෘත්තිකයන් සහ සමාජීය

කටයුතු හා උපදේශන කාර්යයන්හි නිරතවන්නන්ගේ ගණන අවම ප්‍රතිශතයකින් නියෝජනය වී ඇත. ප්‍රතිලාභීන්ගෙන් වැඩිම පිරිසක් කෘෂිකර්මය පදනම් කරගත් ආර්ථික කටයුතු වල නිරත වන බැවින් ඔවුන් බහුතරය ක්ෂේත්‍රභෝග වගාවන් මූලික කරගත් ස්වයං රැකියාවල නිරත වේ.

මීට අමතරව අධ්‍යයනය සඳහා හඳුනාගත් සමෘද්ධි වැඩසටහන් මගින්, දැනට ශ්‍රී ලංකාවේ උග්‍ර ශ්‍රමික හිඟයන් පවතින ක්ෂේත්‍ර ගණනාවකට ඵලදායී වැඩසටහන් නිර්මාණය කර ඇති බව පෙනී යයි. විශේෂයෙන් ම, මේසන්වරුන්, වඩු වැඩකරුවන්. ශිලා සැකසුම්කරුවන්, විදුලි කාර්මිකයින්, අත්කම්කරුවන්, පිරිසිදු කරන්නන්, හා මෝටර් කාර්මිකයන් යනාදී ක්ෂේත්‍ර ගණනාවක් යටතේ ස්වයං රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමට සැලසුම් කර ඇතත් ඒ සඳහා යොමු වූ ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාවන් ඉතා සීමිත ය.

තවද, ශ්‍රී ලංකාවේ වියපත් ජනගහනය ක්‍රමයෙන් ඉහල යන ප්‍රවණතාවයක් පවතින බැවින්, සෞඛ්‍ය හා සහයක සේවා සඳහා ඉහල ඉල්ලුමක් පවතී.

රූප සටහන 2.2.2 ප්‍රතිලාභීන්ගේ මාසික ආදායම් ව්‍යාප්තිය




සමීක්ෂණය සඳහා තෝරාගත් නියැදියෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් සිය මාසික ආදායම රු. 5,000/=ට වඩා අඩු වේයැයි දක්වා ඇත. තවද, මාසික ආදායම රු 20,000/=ට ඉහල පිරිස 6% ක් පමණි. ඒ අනුව, අදාළ වැඩසටහන්වල සෘජු ප්‍රතිලාභීන්ගේ වඩාත් නිවැරදි තොරතුරු කාලීනව සම්පාදනය කිරීමේ හා ඒ අනුව ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ක්‍රමවේදයක් සමෘද්ධි ව්‍යාපාරය තුළින් ඇති කිරීම අත්‍යාවශ්‍ය වනු ඇත.

රූප සටහන 2.2.3 නව රැකියා අවස්ථා නිර්මාණය වීම




මෙම අධ්‍යයනය සඳහා යොදාගත් සමෘද්ධි වැඩසටහන්වල ප්‍රතිලාභීන් විසින් සිය ස්වයං රැකියා ව්‍යාපාරතුළ ජනිතකර ඇති නව රැකියා අවස්ථාවන් පිළිබඳව ඉහත දක්වා ඇත. ඒ අනුව, බහුතර දෙනෙක් තම ව්‍යාපාරය සඳහා ගෙවීම් ලබන ශ්‍රමිකයන් යෙදවීමක් සිදු කර නොමැති බව පෙනී යයි. එනම්, අදාළ ස්වයං රැකියා ඒක පුද්ගල ජීවනෝපාය මාර්ග ලෙස පවතින අතර ව්‍යවසායකත්ව හැකියා ප්‍රවර්ධනය මගින් එම ස්වයං රැකියා වඩාත් සංවර්ධනය කිරීමට අදාළ ප්‍රතිලාභීන් වෙත උපකාරී විය හැකිය.

රූප සටහන 2.2.4 ප්‍රතිලාභීන්ගේ අමතර ආර්ථික කටයුතු

1.උසස් අධ්‍යාපනයේ නිරතවේ
2.වෙනත් රැකියාවක් නොකරයි
3.වෙනත් රැකියාවක් කරයි
4.රැකියාවක් සොයයි
99.සඳහන් කර නොමැත




මෙම සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ අය අතුරින් 48.2% ක් ගේ එකම ආදායම් මාර්ගය දක්වා ඇති ස්වයං රැකියාව බවයි. ප්‍රතිලාභීන් 15.4% කට අමතර ආදායම් මාර්ගයක් ඇති බවයි. එසේම තවත් 5.2% ක් විධිමත් රැකියාවක් අපේක්ෂාවෙන් සිටි. එසේම තම ස්වයං රැකියාව පවත්වාගෙන යන අතරතුර උසස් අධ්‍යාපනය හදාරන ප්‍රතිශතය 1.4% ක් වේ.

රූප සටහන 2.2.5 ස්වයං රැකියාව තෝරා ගැනීමට බලපානලද හේතු




සමෘද්ධි සංවර්ධන වැඩසටහන් යටතේ ස්වයං රැකියාවක් සඳහා යොමු වීමට හේතු වශයෙන් සමීක්ෂණයට ලක්වූවන්ගෙන් 34.7% ක් ඉන් අත්විදිය හැකි නිදහස නිසා ස්වයං රැකියාවක් තෝරාගත් බවයි. තවත් 13.9% කගේ ස්වයං රැකියා ක්ෂේත්‍රයට අභිප්‍රේරණය වීමට මූලික හේතුව ආදායම් ඉපැයීමේ පහසුව යි.

වෙනත් රැකියාවක් නොමැති නිසා මෙම ස්වයංරැකියාවට යොමු වූ ඇති ප්‍රමාණය සමීක්ෂණයට ලක්වූවන්ගෙන් 26.6% කි. තවත් 12.8% කට ස්වයං රැකියාව තම විධිමත් රැකියාවෙහි නිරත වන අතරතුර සිදුකළ හැකි ය.

## 2.3. තිරසර පැවැත්ම

රූප සටහන 2.3.1 ස්වයං රැකියාව පවත්වාගෙන යාමේදී මුහුණ දෙන ගැටළු




1.ආදායම ප්‍රමාණවත් නොවේ 2.වෙළඳපල තරඟකාරිත්වය 3.නිශ්චිත ආදායමක් නොමැතිවීම
4. නීතිරීති 5. රැකියා සුරක්ෂිතතාවයක් නොමැතිවීම
6. වෘත්තීය සෞඛ්‍ය ප්‍රශ්න 7.පිළිගැනීමක් නොමැති වීම

මෙම සමීක්ෂණයට ඉදිරිපත් වූ ප්‍රතිලාභීන් අතුරින් 37.5% කට ජීවනෝපාය ලෙස ස්වයං රැකියාවෙන් ලැබෙන ආදායම ප්‍රමාණවත් නොවන බව දක්වා ඇත. තවද ප්‍රතිලාභීන් අතුරින් 26.8% කට නිශ්චිත ස්ථාවර ආදායමක් ලබාගත නොහැකියි. නිශ්පාදන විකුණා ගැනීමේ දී පවතින වෙළඳපල තරඟකාරීත්වය තවත් ගැටළුවකි. එය 8.2% ක පිරිසකට බලපා ඇත. රැකියා සුරක්ෂිතභාවයක් නොමැති අය 5.7% ක පිරිසකි. වෘත්තීමය සෞඛ්‍ය ප්‍රශ්න බාධකයක් ලෙස දක්වා ඇත්තේ 2.3% ප්‍රතිශතයක ප්‍රමාණයකි.

විශේෂයෙන් ම, ප්‍රතිලාභීන්ගෙන් 64% කට අධික ප්‍රමාණයකට තම ස්වයං රැකියාවේ ආදායම ප්‍රමාණවත් නොවීමට මූලික හේතු වශයෙන් තෝරා ගත් කර්මාන්ත ක්ෂේත්‍රයන්හි ආදායම් උත්පාදන හැකියා සීමිත වීම, වෙළඳ පොල ඉහළ තරඟකාරීත්වය, නිෂ්පාදනවල තාක්ෂණික හා ගුණාත්මක දුර්වලතා මෙන්ම ප්‍රතිලාභීන්ගේ ව්‍යාපාරික ඥානය හා කැපවීමෙහි දුර්වලතා ද හේතු විය හැකි ය.

ඒ අනුව, සමෘද්ධි සංවර්ධන ව්‍යාපෘති මගින් ස්වයං රැකියා අවස්ථා සඳහා යොමු කරනු ලබන අය පිළිබඳව සුදුසු පසු විපරම් ක්‍රමවේදයක් හරහා ඔවුනගේ ගැටළුවලට සුදුසු විසඳුම ලබා දීමේ යාන්ත්‍රණයක් පවත්වාගෙන යාම වැදගත් බව පෙනී යයි.

රූප සටහන 2.3.2 ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමට කැමැත්ත




ඉහත 2.3.2 හි දැක්වූ පරිදි විවිධ බාධක පැවතිය ද, සිය ස්වයං රැකියාව අඛණ්ඩව පවත්වාගෙන යාමට ප්‍රතිලාභීන් අතුරින් 91.2% ක් ම කැමැත්ත ප්‍රකාශ කරඇත. මෙය ඉතා ම යහපත් ප්‍රවණතාවයකි. එසේම සමෘද්ධි ව්‍යාපෘති සඳහා සුදුසු ප්‍රතිලාභීන්

තොරාගැනීමේ ක්‍රමවේදයෙහි ගුණාත්මක බවක් ද මෙයින් නිරූපණය වේ. ඒ අනුව, ඉහත 2.3.2 හි දැක්වූ ආකාරයේ බාධාවන් මගින් මෙම ප්‍රතිලාභීන් දුර්වල වී තම ව්‍යාපර ක්ෂේත්‍රයෙන් ඉවත් වීමට පෙර එම ගැටළු සඳහා ඉක්මන් විසඳුම් ලබා දීමේ ක්‍රමවේද හඳුන්වා දීම අත්‍යාවශ්‍ය වනු ඇත.

තවද, ස්වයංරැකියා නියුක්තිකයන් අතරින් 4.6% තම ආර්ථික කටයුත්ත අඛණ්ඩව කරගෙන නොයන බව සඳහන් කර ඇත. එවැනි ප්‍රතිලාභීන් සඳහා විකල්ප ආදායම් උත්පාදන අවස්ථා සැලසීම මගින් එම කුටුම්භයන් නැවත දිළිඳුබවට පත්වීම වැලැක්වීමේ අවශ්‍යතාවය ද පවතී.

### 2.3.3 ස්වයංරැකියාව වැඩිදියුනු කිරීමට අවශ්‍ය පහසුකම්

තම ස්වයං රැකියාව අඛණ්ඩව සිදුකරගෙන යාමට කැමැත්ත පළකළ අය වෙතින් ඒ සඳහා බලාපොරොත්තු වන පහසුකම් පිළිබඳව මෙම සමීක්ෂණයේ දී විමසන ලද අතර, ප්‍රතිලාභීන් අතුරින් 62.7% කට මූලික අවශ්‍යතාවය තම ව්‍යාපාරය වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය මූල්‍ය සහාය යි. තවද, ප්‍රතිලාභීන් 8.3% කගේ මූලික අවශ්‍යතාවය වන්නේ තාක්ෂණික සහාය යි. සිය නිශ්පාදනයන් අලෙවි කර ගැනීමට වෙළඳපොල සහය ඉල්ලා ඇති පිරිස මුළු ප්‍රතිලාභින්ගෙන් 8% කි. ස්වයං රැකියාව දියුණු කර ගැනීමට භූමිය හා නීතිමය බාධාවන් ද ඇත්තේ සුළු පිරිසකටයි.

ඒ අනුව සැලකීමේ දී, අදාළ ව්‍යාපාර ශක්‍යතාවය විමර්ශනය කොට අතිරේක කාරක ප්‍රාග්ධනය ලබා ගැනීම සඳහා මෙම ප්‍රතිලාභීන් සුදුසු මූල්‍ය ආයතන වෙත හෝ ප්‍රාථමික කර්මාන්ත ප්‍රවර්ධන අමාත්‍යාංශය වැනි රජයේ ආයතන හරහා සංවිධානය කෙරෙන කර්මාන්ත ප්‍රවර්ධන ව්‍යාපෘති වෙත යොමු කිරීම ද සුදුසු වන බව යෝජනා කෙරේ.

රූප සටහන 2.3.3 ස්වයං රැකියාව පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම්




රූප සටහන 2.3.4 නිර්මාණය කලහැකි රැකියා අවස්ථා ගණන




මෙම සමීක්ෂණයට බඳුන් වූ ප්‍රතිලාභීන් යටතේ දැනට රැකියාවන්හි නියුක්ත පිරිසට අමතරව ඉදිරියේ දී නව රැකියා අවස්ථා බිහි කිරීමේ ඇති හැකියාව ද මෙමගින් විමසන ලද අතර, ඒ සඳහා ලද ප්‍රතිචාර අනුව අතිරේක එක් රැකියා අවස්ථාවක් බිහිකළ හැකි අය ප්‍රතිලාභින් අතුරින් 22.6% කි. තවද, එක් අයකුට වඩා අවස්ථාවන් සැලසීමට 15% ක පමණ ප්‍රතිශතයකට හැකියාව ඇත.

# III වන පරිච්ඡේදය

## 3.1.දත්ත විශ්ලේෂණය

රූප සටහන 3.1.1දිස්ත්‍රික්ක මට්ටමින් වයස් ව්‍යාප්තිය




(1) අවු. 20 ට අඩු (2) අවු. 21 හා 30 අතර (3) අවු. 31හා 40 අතර
(4) අවු. 41 හා 50 අතර (5) අවු. 50ට ඉහල (6) සඳහන් කර නොමැති

ඉහත දිස්ත්‍රික්ක හතරහි වයස් ව්‍යාප්තිය සැලකූ කල 75% කට වැඩි ප්‍රතිශතයක් අවු 30ට වැඩි පුද්ගලයන්ගේ නියෝජනයක් දක්නට ඇත.පුත්තලම දිස්ත්‍රික්කය සැලකූ කල වයස් ව්‍යාප්තිය 40% ට වැඩි ප්‍රමාණයක් අවු 31- 40 ත් අතර පිරිසයි. ඒ සෑම දිස්ත්‍රික්කයක ම තරුණ පිරිස 15% ට අඩු ප්‍රතිශතයක් නියෝජනය වී ඇත.

රූප සටහන  3.1.2 දිස්ත්‍රික්ක මට්ටමින් ස්ත්‍රී-පුරුෂ ව්‍යාප්තිය




සමීක්ෂණය සඳහා යොදාගත් දිස්ත්‍රික්ක හතරෙන් යාපනය දිස්ත්‍රික්කයේ පමණක් 55% ක බහුතර පුරුෂ ප්‍රතිශතයක් නියෝජනයවී ඇත. අන් සෑම දිස්ත්‍රික්කයකම 55%කට වැඩි ස්ත්‍රී ප්‍රතිශතයක් නියෝජනය වේ.

රූප සටහන 3.1.3 ප්‍රතිලාභීන්ගේ සිවිල් තත්ත්වය




සිවිල් තත්ත්වය සැලකූ කල ඉහල බහුතරයක් දිස්ත්‍රික්ක 4 හිම විවාහක පුද්ගලයන් නියෝජනය කරයි. අවිවාහක පුද්ගලයින් සෑම දිස්ත්‍රික්කයකම 15% කට වඩා අඩු ප්‍රතිශතයකි.

රූප සටහන 3.1.4ප්‍රතිලාභීන්ගේ අධ්‍යාපන තත්ත්වය දිස්ත්‍රික්කයන් අනුව




අධ්‍යාපන තත්ත්වය සලකන විට එය සාමාන්‍යපෙළට පහල තත්ත්වයෙන් ඇති පුද්ගලයන් ප්‍රතිශතය 40% කට ඉහල අගයක් ගෙන ඇත. සාමාන්‍ය පෙල සමත් පිරිසද සියයට 18 කට ඉහල අගයක් ගෙන ඇත.

## 3.2 ප්‍රතිලාභින්ගේ වෘත්තීමය සංවර්ධනය

රූප සටහන 3.2.1ප්‍රතිලාභීන් නිරත වන වෘත්තීය ක්ෂේත්‍ර දිස්ත්‍රික්ක මට්ටමින්












| | | | |
|---|---|---|---|
| 61 | ක්ෂේත්‍ර භෝග හා එළවළු වවන්නන් හා සත්ව පාලනය | 51 | පිරිසිදු කරන්නන් හා කාර්යාලවල ගෘහපාලන අධීක්ෂකවරුන් |
| 81 | ලිං කපන්නන්, බෝරකරුවන්, ශිලා සැකසුම්කරුවන් | 74 | විදුලි කාර්මිකයින් හා සේවා සපයන්නන් |
| 71 | මේසන්වරුන්, වඩු වැඩකරුවන් | 75 | ලී වැඩ, යන්ත්‍ර සැකසුම් කරුවන් හා ක්‍රියාකරුවන් |
| 52 | සෞඛ්‍ය සේවා සහයකයින්, වෙළඳ සහයකයින් | 94 | මුළුතැන්ගෙයි උදව්කරුවන් |
| 62 | වන හා ආශ්‍රිත සේවකයින්, ධීවර කටයුතු කරන්නන් | 91 | ගෘහස්ථ පිරිසිදු කරන්නන් හා උදව් කරුවන් |
| 31 | රසායන හා භෞතික විද්‍යා තාක්ෂණඥයින්, ආකර හා මැනුම් තාක්ෂණඥයින් | 53 | ගෘහස්ථ පදනම් කරගත් සාත්තු සේවකයින් |
| 92 | ගොවිපල කම්කරුවන්, වනෝද්‍යාන කම්කරුවන් | 32 | හෙද හා ආශ්‍රිත වෘත්තිකයන් |
| 72 | උපකරණ සාදන්නන්, මෝටර් වාහන සාදන්නන් හා කාර්මිකයින් | 41 | පද සැකසුම් ක්‍රියාකරුවන් |
| 83 | කාර්, වෑන්, කුලීරථ, දොඹකර පදවන්නන් | 34 | සමාජීය කටයුතු ආශ්‍රිත වෘත්තිකයින් |
| 73 | වර්ගීකරණය නොකල හස්ත කර්මාන්ත සේවකයන් | 26 | සමාජීය කටයුතු හා උපදේශක වෘත්තිකයින් |

දිස්ත්‍රික්කයන් 4 හිම වැඩිම පිරිසක් නිරත වී සිටින්නන් අයත් වන්නේ ක්ෂේත්‍ර භෝග හා එලවළු වවන්නන් හා සත්ව පාලනය කරන්නන් යන ක්ෂේත්‍රයටයි.අනෙකුත් දිස්ත්‍රික්කයන්ට සාපේක්ෂව හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර භෝග හා එළවළු වවන්නන් හා සත්ව පාලන ක්ෂේත්‍රයට අමතර ක්ෂේත්‍ර වලද නිරතවන්නන් සාපේක්ෂව ඉහල අගයක් ගෙන ඇත.

### රූප සටහන 3.2.2ප්‍රතිලාභීන්ගේ මාසික ආදායම් ව්‍යාප්තිය දිස්ත්‍රික්ක අනුව



ආදායම රු 5000/= අඩු ආදායමක් ලබන පිරිස දිස්ත්‍රික්ක හතර වෙන වෙනම සැලකුවද ඉහලම ප්‍රතිශතයක් ගෙන ඇත.

රූප සටහන 3.2.3 නව රැකියා අවස්ථා නිර්මාණයවීම




නව රැකියා අවස්ථා නිර්මාණය කරමින් වැඩිම පිරිසක් ස්වයං රැකියාවේ නිරතවී ඇත්තේ පුත්තලම දිස්ත්‍රික්කයේ ය.යාපනය දිස්ත්‍රික්කයේ සවයං රැකියා නිරත වන්නන් නව රැකියා අවස්ථා එකක් නිර්මානය කර ඇත්තේ21.5% කි. ස්වයං රැකියා නියුක්තිකයන් විසින් රැකියා අවස්ථා 16ක් නිර්මානය කර ඇති අතර එය පුත්තලම දිස්ත්‍රික්කයේ මුළු ගනනින් 0.5% ක ප්‍රමාණයක් වේ.නිර්මාණය කලහැකි රැකියා අවස්ථා ගණන සඳහන් කර නොමැති පිරිස් හි ප්‍රතිශතයන් මෙහි දක්වා නොමැත.

රූප සටහන 3.2.4 අමතර ආර්ථික කටයුතු වල යෙදීම




ස්වයං රැකියාව එකම ජීවනෝපාය ලෙස සිදු කරන ප්‍රමාණය පුත්තලම දිස්ත්‍රික්කයේ 41.4% කි. යාපනය දිස්ත්‍රික්කයේ 44.8% කි.හම්බන්තොට දිස්ත්‍රික්කයේ වැඩිම ප්‍රතිශතය 58.1% වන අතර මඩකලපුව දිස්ත්‍රික්කයේ 49.8% ක ප්‍රතිශතයකි. ස්වයං රැකියාවට අමතරව තවත් රැකියාවක නිරත වන පිරිස 19% ක් පුත්තලම දිස්ත්‍රික්කයේද 17% යාපනය දිස්ත්‍රික්කයේද 12.8% හම්බන්තොට දිස්ත්‍රික්කයේද 12.4% මඩකලපුව දිස්ත්‍රික්කයේද සිටී. ස්වයං රැකියාවට අමතරව කරගෙන යාමට හෝ , සවයං රැකියාව වෙනුවට නව රැකියා සොයන්නන් 1.4% පුත්තලම දිස්ත්‍රික්කයේද 10.1% ක් යාපනය දිස්ත්‍රික්කයේද 1.3% හම්බන්තොට දිස්ත්‍රික්කයේද වේ.

රූප සටහන 3.2.5 ස්වයං රැකියාව තෝරා ගැනීමට හේතු




1.නිදහස
2.ඉපයීමට පහසුබව
3.රැකියාවක නිරතවන අතරතුර නිරතවිය හැක
4.රැකියාවක් නොමැති නිසා
99.සඳහන්කර නොමැත

ස්වයං රැකියාව නිසා අත්විඳිය හැකි නිදහස නිසා එවන් රැකියාවක් තෝරා ගෙන ඇත්තේ 53.3% පුත්තලම දිස්ත්‍රික්කයේ ස්වයං රැකියා ලාභීන් ය.යාපනය දිස්ත්‍රික්කයේ 26.6% ක් නිදහස් නිසා ස්වයං රැකියාව තෝරා ගෙන ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ එය 45.4% කි.මඩකලපුව දිස්ත්‍රික්කයේ 21.1% නිදහස නිසා සවයං රැකියාව සිදුකරනු ඇත. ආදායම් ඉපයීමට පහසු නිසා ස්වයං රැකියාව තෝරා ගත් ගණන මඩකලපුව දිස්ත්‍රික්කයේ 24.7% කි. යාපනය දිස්ත්‍රික්කයේ එය 14.1% කි.හම්බන්තොට දිස්ත්‍රික්කයේ 7.9% කි. පුත්තලම දිස්ත්‍රික්කයේ එය 7.1%කි.

## 3.3. තිරසර පැවැත්ම

රූප සටහන 3.3.1 ස්වයං රැකියා පවත්වාගෙන යාමේදී මුහුණ දෙන ගැටළු




ස්වයං රැකියාව පවත්වාගෙන යාමේදී මඩකලපුව දිස්ත්‍රික්කයේ 51.0% සඳහන් කරන්නේ ආදායම ප්‍රමාණවත් නොවීමයි. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ද 38.3% කට ආදායම ප්‍රමාණවත් නොවීමයි.යාපනය දිස්ත්‍රික්කයේ 32.3% කට ආදායම ප්‍රමාණවත් නොවේ. පුත්තලම දිස්ත්‍රික්කයේ 29.5% කට ආදායම ප්රමාණවත් නොවීම මුහුණ දෙන ගැටළුවකි. මඩකලපුව දිස්ත්‍රික්කයේ තවත් 31.1% කට නිශ්චිත ආදායමක් නොමැති වීම ගැටළුවකි. හම්බන්තොට දිස්ත්‍රික්කයේදී 13.7% කට නිශ්චිත ආදායමක් නොමැතිවීම ගැටළුවක් වන අතර යාපනය දිස්ත්‍රික්කයේ එය 42.9% කි. පුත්තලම දිස්ත්‍රික්කයේ තවත් 7.6% කට නිශ්චිත ආදායමක් නොමැතිවීම ගැටළුවකි.

රූප සටහන 3.3.2 ව්‍යාපාර අඛණ්ඩව පවත්වාගෙන යාමට කැමැත්ත




1.අඛන්ඩව නිරතවීමට අපේක්ෂා කරයි 2.අඛන්ඩව නිරතවීමට අපේක්ෂා නොකරයි
99.සඳහන් කර නොමැත

යාපනය දිස්ත්‍රික්කයේ වැඩිම ප්‍රතිශතයක්(90.2%) තම ව්‍යාපාරය අඛණ්ඩව කරගෙන යාමට අපේක්ෂා කරයි. පුත්තලම දිස්ත්‍රික්කයේ(78.2%) අඩුම ප්‍රතිශතයක එය දක්නට ඇත.

රූප සටහන 3.3.3 ස්වයං රැකියාව වැඩිදියුණු කිරීමට අවශ්‍ය පහසුකම්




ස්වයං රැකියාව දියුනු කරගැනීමට අවශ්‍ය සහය කුමන ආකාරයෙන් විය යුතු යැයිදවිමසා බැලීමද මෙම සමීක්ෂණය මගින් සිදුකෙරිනි. ඉහත රූප සටහනට අනුව දිස්ත්‍රික්ක 4 න්ම වාර්තා වී ඇති පරිදි වැඩිම ප්‍රතිශතයකින් දක්වා ඇත්තේ මූල්‍ය සහය අවශ්‍ය බවයි. ඒ බව පුත්තලම දිස්ත්‍රික්කයේ 62.9% කි. යාපනය දිස්ත්‍රික්කයේ එය 59.8%කි.හම්බන්තොට දිස්ත්‍රික්කය හා මඩකලපුව දිස්ත්‍රික්කයේවෙන වෙනම සැලකූ කල 54.2% හා 74.5% ලෙස වේ. තම ව්‍යාපාරය දියුනු කිරීමට වෙළඳපල සහය අවශ්‍යයයි පවසා ඇත්තේ සුළු ප්‍රතිශතයන්ගෙනි. පුත්තලම දිස්ත්‍රික්කයේ සමීක්ෂණයට සහභාගී වූ ස්වයං රැකියා කරන්නන්ගෙන් 4.3% කි. යාපනය දිස්ත්‍රික්කයේ රැකියා නියුක්තවන්නන්ගෙන් 9.8% කට වෙළඳපල සහය අවශ්‍ය වේ.හම්බන්තොට දිස්ත්‍රික්කයේ එය 10.1% කි.මඩකලපුව දිස්ත්‍රික්කයේ එය 6.8%කි. අවශ්‍ය පහසුකමක් ලෙස භූමිය දක්වා ඇත්තේ ද එවන් සුළු ප්‍රතිශතවලිනි.නීතිමය බාදා ඉවත් කිරිම සිය ස්වයං රැකියාවදියුණු කර ගැනීමට අවශ්‍ය පහසුකමක් ලෙස දක්වා ඇත්තේ අවම ප්රතිශත වලිනි.

රූප සටහන 3.3.4 උත්පාදනය වියහැකි රැකියා අවස්ථා




ස්වයං රැකියා කරන්නන්ගේ විභව තාවය විමසූ කල ඊට ප්‍රතිචාර දක්වා තිබුනේ අළුතින් රැකියා අවස්ථාවන් ඉපිද විය හැකි ප්‍රමාණයයි. ඉන් වැඩිම පිරිසක් දක්වා තිබුනේ තමන්ගේ ස්වයං රැකියාව මගින් නව එක් රැකියා අවස්ථාවක් දියහැකි බවයි.හම්බන්තොට 27.8%ද,පුත්තලම 21% ද, මඩකලපුව 33.5% ද,යාපනය 13% ද වේ.යාපනය හා හම්බන්තොට දිස්ත්‍රික්කයන්ගේසවයං රැකියා කරන්නන් අතරින් තවත් රැකියා අවස්ථා 10 ක් දිය හැකි යයිසඳහන් කල පිරිසද පිළිවෙලින් 0.3% හා 0.4% ප්‍රතිශත වලින් දක්වා ඇත.කිසිත් සඳහන් කර නොමැති පිරිසද බහුතර ප්‍රතිශතයක් වී ඇත.ඒවායේ ප්‍රතිශත මෙහි දක්වා නොමැත.

## IV වන පරිච්ඡේදය

### 4.1. නිගමන හා යෝජනා

ඉහත දැක්වූ විශ්ලේෂණයන් අනුව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් 2016 වර්ෂය තුළ ඉලක්කගත පුද්ගලයන්ට ලබා දී ඇති විවිධ සහනාධාර හරහා ජනිත කරන ලද ස්වයං රැකියා අවස්ථා ඉහළ ගුණත්වයක් සහිත වූ බව නිරීක්ෂණය වේ.

එම ස්වයං රැකියාලාභීන්ගේ ආදායම් ප්‍රවර්ධනය කිරීම හා ව්‍යාපාර ස්ථාපීකරණය තහවුරු කිරීමේ අවශ්‍යතාව නිරීක්ෂණය වන අතර ඒ සඳහා මූලික අවශ්‍යතාවයක් ලෙස අදාළ ප්‍රතිලාභීන් පිළිබඳ පසු විපරම් යාන්ත්‍රණයක් හරහා එම අයගේ ව්‍යාපාරික ගැටළු සඳහා කඩිනම් විසඳුම් ලබා දීම යෝජනා කෙරේ.

තවද, ඉදිරියේ දී ස්වයං රැකියා ක්ෂේත්‍රය සඳහා සහනාධාර ලබාදීමේ ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට පහත දැක්වෙන යෝජනා ද ඉදිරිපත් කෙරේ.

* සමස්ථ ස්ත්‍රී නියෝජනය වැඩි වුවත් යාපනය දිස්ත්‍රික්කයේ පමණක් පුරුෂ නියෝජනය ස්ත්‍රී නියෝජනයට වඩා වැඩිවී ඇත. එබැවින් යාපනය දිස්ත්‍රික්කයේ පුරුෂයින් ඉලක්ක කරගත් ස්වයං රැකියා වැඩසටහන් කෙරෙහි වැඩි අවධානයක් යොමුවිය යුතුය.

* සාමාන්‍ය පෙළ හා ඊට පහළ අධ්‍යාපනයක් සහිතව පාසල් හැරයන්නන් සඳහා ඉලක්කකර ගත් වෘත්තීය පුහුණු පාඨමාලා විවිධාංගීකරණය කල යුතුය.

* අධ්‍යාපන තත්ත්වය ඉහල අයට වුවද ස්වයං රැකියාවන් ආරම්භ කිරීමට ඉඩහසර ලබාදිය යුතුය.

* ස්වයං රැකියාවන් සිදුකරන්නන් සඳහා ඇති සමාජයීය පිළිගැනීම වැඩි කිරීම කළ යුතුය.

* ස්වයං රැකියා ආරම්භ කිරිමට තරුණයින් දිරිමත් කළ යුතුය. පාසල් අධ්‍යාපනයේ ඉහල ශ්‍රේණි වලදී මෙම දැනුවත් කිරීම වඩාත් ප්‍රායෝගිකව සිදු කළ හැකි ය.

* ස්වයං රැකියා කරන්නන්ගේ නිෂ්පාදන වල ඵලදායිතාවය හා ප්‍රමිතිය ඉහල නැංවීම කළ යුතු අතර ඒවා වෙළඳපලට නිකුත්කිරීමට අවශ්‍ය ඉඩ පහසුකම් සැලසිය යුතුය.

* ස්වයං රැකියා කරන්නන් සඳහාම ඉලක්ක කරගත් සහණ ණය යෝජනා ක්‍රමයන් හඳුන්වා දිය යුතුය.

* ස්වයං රැකියා හිමියන් ප්‍රවර්ධනය කිරීම මගින් නව රැකියා අවස්ථා ජනිත කිරීමේ හැකියාව ඇත. රැකියා වියුක්තිය අවම කිරීමට ගත යුතු පියවරයන් මෙවැනි ස්වයං රැකියා කරන්නන් සවිබල ගැන්වීම හරහා සිදුකළ හැක.

* සමෘද්ධි සංවර්ධන වැඩසටහන්හි ප්‍රතිලාභීන් සෞඛ්‍ය සේවා සහායක, ගෘහස්ත පාදක සාත්තු සේවා, හෙද හා ආශ්‍රිත සේවාවන් සඳහා යොමු වීම වඩාත් සාධනීය තත්ත්වයක් නිර්මාණය කරන අතර රැකියා විරහිත තරුණ-තරුණියන් මේ අවස්ථාවන් සඳහා උනන්දු කළ හැක.

# විශේෂ ස්තූතිය

* මෙම සමීක්ෂණ කාර්යය මනාව සැලසුම් කිරීම හා ව්‍යාපෘති පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමන් ඇතුළු කළමණාකාරීත්වය වෙතින් ලද නොමසුරු අනුග්‍රහය ද, සමීක්ෂණ දත්ත රැස් කිරීමේ දී එම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් වෙතින් ලද සහාය ද කෘතඥතා පූර්වකව සඳහන් කරමු.

* තවද, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජනරාල් හා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල් නීල් බණ්ඩාර හපුහින්න මහතා වෙතින් ලද උපදෙස් හා මඟපෙන්වීම කෘතඥතා පූර්වකව සඳහන් කරමු.